# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 37 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2005 නොවැම්බර් මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2005 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 5.50 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි

## 2005 අංක 37 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 නොවැම්බර් මස 21 වන දින]

එල්. ඩී.— ඕ. 86/2002.

### 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2005 අංක 37 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනතට 3අ, 3ආ, 3ඇ, 3ඈ, 3ඉ, 3ඊ, අලුත් වගන්ති ඇතුළත් කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනතේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 3අ, 3ආ, 3ඇ, 3ඈ, 3ඉ, 3ඊ, වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

"නිරවුල් නොකිරීමේ සහතිකයක් නොමැතිව කිසිම අධිකරණ කටයුත්තක් නොකළ යුතු බව.

3අ. (1) මේ පනත ප්‍රකාරව ආරාවුලක් සමථය මගින් විසඳා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට සමථකරණ ගිවිසුමක් යටතේ පාර්ශ්වයක් එකඟ වී ඇති අවස්ථාවක, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, 3ඊ වගන්තියේ සඳහන් නිරවුල් නොකිරීමේ සහතිකයක් ඉදිරිපත් කර ඇත්නම් මිස, වාණිජ ආරාවුලක් සම්බන්ධයෙන් කිසිම නඩු කටයුත්තක් පැවරීම හෝ අධිකරණයක් විසින් නඩු කටයුත්තක් භාර ගැනීම නොකළ යුතු ය.

(2) ආරාවුලට සම්බන්ධ පාර්ශ්වයන් විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ V වන කොටස යටතේ තාවකාලික පිළියමක් පිළිබඳව සහනයක් අපේක්ෂා කරන අවස්ථාවක (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර, එවැනි කාරණයක් සම්බන්ධයෙන් පවරා ඇති යම් නඩුවක් ඒ කාරණය එකී තාවකාලික පිළියම ලබා දීම හා සම්බන්ධයෙන් වන තාක් දුරට පමණක් අධිකරණය විසින් භාරගනු ලැබීම හෝ තීරණය කරනු ලැබීම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා සමථකරණ ගිවිසුමක්, ගිවිසුමක ඇතුළත් සමථ වගන්තියක ආකාරයෙන් හෝ නිර්වචනය කළ නෛතික

සම්බන්ධතාවකට අදාළව තමන් අතර උද්ගත විය හැකි සියලු ආරාවුල හෝ යම් ආරාවුලක් සමථකරණය මගින් බේරුම් කිරීම සඳහා යොමු කිරීමට පාර්ශ්වකරුවන් එකඟවන, ගිවිසුම්ගත හෝ අන්‍යාකාර වූ එකඟවීමක ආකාරයෙන් හෝ විය හැකි ය.

මධ්‍යස්ථානයේ රීති ප්‍රකාරව ආරාවුල් සමථයකට පත්කළ යුතු බව.

3ආ. සමථ කිරීම මගින් යම් ආරාවුලක් විසඳා ගැනීම සඳහා මධ්‍යස්ථානය වෙත කරනු ලබන ඉල්ලීමක්, 12 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන රීති ප්‍රකාරව විසඳිය යුතු ය.

රහස්‍යභාවය.

3ඇ. ඉදිරිපත් කර ඇති ලියවිලි සම්බන්ධයෙන් හෝ පවත්වනු ලබන සමථ සැසිවාර කාල තුල දී අනාවරණය වන්නා වූ හෝ සාකච්ඡා කරනු ලබන්නා වූ වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් ආරාවුලට සම්බන්ධ සෑම පාර්ශ්වයක් සහ සෑම සමථකාරවරයකු විසින් රහස්‍යභාවය ආරක්ෂා කිරීම ඔවුන්ගේ කාර්යය විය යුතු ය.

සමථ සැසිවාරවල දී ප්‍රකාශයක් කරනු ලබන තැනැත්තන්ගේ වරප්‍රසාද.

3ඈ. (1) සමථ සැසිවාරයක දී ප්‍රකාශයක් කරනු ලබන සෑම තැනැත්තකුටම ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් අධිකරණයක් ඉදිරියේ සාක්ෂි දෙනු ලබන සාක්ෂිකරුවකු විසින් ඒ සාක්ෂි සම්බන්ධයෙන් හිමිකම් ඇත්තා වූ සියලු වරප්‍රසාද සඳහා ඒ අයුරින්ම හිමිකම් තිබිය යුතු ය.

(2) සමථ සැසිවාරයක දී යම් තැනැත්තකු විසින් කරනු ලබන ප්‍රකාශයක් යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සාක්ෂි වශයෙන් ආවේශ්‍ය නොකරනු ලැබිය යුතු ය.

නිරවුල් කිරීමේ එකඟතාවය.

3ඉ. ආරාවුලකට සම්බන්ධ පාර්ශ්වයන් යම් නිරවුල් කිරීමක් සඳහා එකඟවන අවස්ථාවක දී, එකී එකඟතාවයේ නියමයන් —

(අ) ලිඛිතව සඳහන් කළ යුතු ය ; සහ

(ආ) පාර්ශ්වයන් විසින් අත්සන් කරනු ලැබිය යුතු ය ; සහ

(ඇ) පාර්ශ්වයන් අතර බැඳීමක් ඇති කළ යුතු අතර වලංගු ගිවිසුමක් වශයෙන් නීතියෙහි ලා බලාත්මක විය යුතු ය.

නිරවුල් නොකිරීමේ සහතිකය.

3ඊ. (1) ආරාවුල හා සම්බන්ධ පාර්ශ්වයන් විසඳුමක් සඳහා එකඟ නොවන අවස්ථාවක දී, එකී ආරාවුල සම්බන්ධයෙන් සමථ ක්‍රියාවලිය කළමනාකරණය කර ඇත්තා වූ සමථකාරවරයා හෝ සමථකාරවරුන් විසින් එකී ආරාවුල සමථ කිරීමෙන් නිරවුල් කළ නොහැකි බව ප්‍රකාශ කරමින් සහතිකයක් නිකුත් කළ යුතු ය. එකී සෑම සහතිකයක් ම අවස්ථාවෝචිත පරිදි සමථකාරවරයා හෝ සමථකාරවරුන් විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් ඕනෑම අධිකරණයක පවරා ඇති යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සාක්ෂි ලෙස ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එහි සාක්ෂි ඔප්පු කිරීමක් වශයෙන් එය නිකුත් කළ තැනැත්තා කැඳවීම අවශ්‍ය නොවිය යුතු ය.

(3) නිරවුල් නොකිරීමේ සහතිකයේ යම් සමථකාරවරයකුගේ අත්සන අව්‍යාජ බවට සහ එහි අත්සන් කරනු ලබන සමථකාරවරයාට එසේ කිරීමට බලය ඇති බවට අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකි ය :

එසේ වුව ද, යම් නඩුවක දී යම් පාර්ශ්වයක් විසින් කරන ලද ඉල්ලීමක් මත හෝ අන්‍යාකාරයකට සහ වාර්තාගත කළ යුතු හේතු අනුව එම අධිකරණය ඉදිරිපිට පැවැත්වෙන යම් නීති කෘත්‍යයක දී සමථකාරවරයා පැමිණ සාක්ෂි දිය යුතු බව අධිකරණයේ මතය වන්නේ නම්, එම සහතිකය අත්සන් කිරීමට අදාළව සාක්ෂි දීමේ කාර්යය සඳහා පමණක් එම සමථකාරවරයා සාක්ෂිකරුවකු ලෙස කැඳවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඊ) වෙළෙඳ හා වාණිජ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙක්. ".

(2) එම වගන්තියේ (6) වැනි උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(7) (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), හෝ (ඈ) යන ඡේදවල නිශ්චිතව දක්වා ඇති පරිදි වාණිජ හෝ වෙළෙඳ මණ්ඩල නියෝජනය කිරීම සඳහා එම ඡේද යටතේ මණ්ඩලය වෙත පත් කරනු ලැබූ සාමාජිකයකු ඔහු නියෝජනය කරන වාණිජ හෝ වෙළෙඳ මණ්ඩලයේ සාමාජිකයකු වීම අවසන් වුවහොත්, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ධුර දැරීම අවසන් විය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.